## නිපුණතා මට්ටම 1.6 : රංග භූමිය

**ක්‍රියාකාරකම** : රංග භූමි හඳුනා ගනිමු

**රංග භූමියක් යනු කුමක් ද?**

**නාට්‍යයක් රඟ දක්වන ඕනෑ ම ස්ථානයක් රංග භූමියක් වශයෙන් හැඳින්වේ.**
රංග පීඨය, කරළිය, රඟමඬල, වේදිකාව යන නම්වලින් ද රංග භූමිය නම් කෙරේ.

**අතීතයේ ගිනිමැල භූමිය, පූජා භූමිය, යාග භූමිය හා කමත ආදී ස්ථානවලින් මෙම කාර්යය ඉටු විය.**

| | |
|---|---|
| සොකරි නාට්‍යයේ දී රංග භූමිය ලෙෂ | කමත |
| කෝලම්වල දී රංග භූමිය | තානායම්පොළ |
| නාඩගම්වල දී එය | කරළිය |











එතැන් සිට වර්තමානය දක්වා 'නූතන වේදිකාව' විකාශනය වී ඇත. එළිමහනේ සිදුවන ඉහත කී අවස්ථා එළිමහන් රංගභූමිවල සිදුවූ කාර්යයන් ය. නූර්ති වර්ධනය වීමත් සමග විවෘත්ත ස්ථානවල සිදුවූ එම කාර්යය, ගෘහස්ථ නොහොත් ප්‍රෙක්ෂකයා සහ රඟහල වටකොට තැනූ, අව්වට වැස්සට බාධා නොවන ආවරණයක් සහිත අභ්‍යන්තර ස්ථානයක සිදු කරන ලදී. රඟහල නම් අත්දැකීම මුල්වරට ලැබෙන්නේ නූර්ති නාටකයෙනි.

නූතන වේදිකාව ප්‍රොසීනියම් වේදිකාව (*Procenium Arch Stage*) නමින් හඳුන්වන අතර එය ගෘහස්ථ වේදිකාවකි. අපට බොහෝමයක් හමුවන්නේ ඉහත සඳහන් ආවරණය කරන ලද රංග ශාලා වන නමුත් ඉතා සාර්ථක එළිමහන් රංග භූමි ද පවතී. (උදාහරණ : පේරාදෙණියේ වල නමින් හඳුන්වන සරච්චන්ද්‍ර එළිමහන් රංග පීඨය)



ග්‍රීසියේ පිහිටි දියෝනීසියස් රඟමඩල පුරාතන බටහිර නාට්‍ය ඉතිහාසයේ හමුවන දැවැන්ත එළිමහන් රංග භූමියකි.

**රංග භූමියක තිබිය යුතු මූලික ලක්ෂණ මොනවා ද?**

▲ රංග භූමිය සමතලා බිමක් විය යුතු ය.
▲ රඟ පෑමට ප්‍රමාණවත් අවකාශයක් තිබිය යුතු ය.
▲ ප්‍රේක්ෂක පිරිසකට පහසුවෙන් නැරඹිය හැකි වන සේ පිහිටා තිබිය යුතු ය.
▲ රංග ශිල්පීන්ට අවශ්‍ය වන අවම පහසුකම්වලින්වත් රංග භූමිය සමන්විත විය යුතු ය.

(පසුතල, රංග භාණ්ඩ ආදිය තාවකාලිකව තබා ගැනීමට ඉඩකඩ ඇති ස්ථානයක් හා ඇඳුම් මාරු කිරීම, අංග රචනය කිරීම ආදිය සඳහා නේපත්‍යාගාරයක් රංගහල ආසන්නයේ තිබීම අවශ්‍ය වේ. රංග ශාලාවක අනවශ්‍ය ශබ්ද වලින් බාධා ඇති වීම, වේදිකාවට අනවශ්‍ය ලෙස ආලෝකය වැටීම, අධික උණුසුම, ප්‍රේක්ෂාගාරයේ අනවශ්‍ය බාධා කිරීම්, විදුලිබලය ඇනහිටීම සිදු නොවිය යුතු ය.)

**රංග භූමි ප්‍රභේද**

▫ රංග භූමිය එළිමහන් හා ගෘහස්ථ වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකි ය.
▫ වට රවුම් (කවාකාර, ඇරීනා) රංග භූමි, අර්ධ කවාකාර රංගභූමි, ප්‍රොසීනියම් (පින්තූර රාමු) හෙවත් ආරුක්කු වේදිකාව ද වශයෙන් නූතන රංග භූමි ප්‍රභේද කිහිපයක් ඇත.

▫ සමහර රංග භූමි තුළ කැරකෙන වේදිකා යනුවෙන් අමතර රංග ප්‍රදේශයක් දක්නට ලැබේ. නූතනයේ ජංගම වේදිකාවන් ද දක්නට ලැබේ.

1) ප්‍රොසීනියම් රාමු රංග වේදිකාව (*Procenium Arch Stage*)
2) ප්‍රක්ෂේපිත රංග ශාලාව (*Thrust Theatre*)
3) එරීනා රංග ශාලාව (*Arina Theatre*)
4) වට වේදිකාව (*Theatre- in the Round*)
5) එළිමහන් රඟහල (*Open Aria Theatre*)
7) ජංගම වේදිකාව (*Caravan*), (*Platform Stage*)
8) ජපානයේ කබුකි වේදිකාව (*Kabuki Theatre* )


සන්දර්ශන කරත්ත (Caravan)







**ක්‍රියාකාරකම 1**
රංග භූමියක තිබිය යුතු මූලික ලක්ෂණ පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම 2**
නූතන වේදිකාව දක්වා රංග භූමියේ විකාශනය  පැහැදිලි කරන්න.